T. Vykundanathan/ICRC

"මගේ කණ්ඩායමේ ඉන්න මම වගේම අතුරුදහන් වුණ ස්වාමි පුරුෂයින්ගේ බිරින්ඳෑවරු එක්ක කතා කළ පසු මට වඩාත් සැහැල්ලු බවක් සතුටක් දැනෙනවා. සමහර වෙලාවට මම වගේ අනෙක් කාන්තාවන්ට මම අවවාදත් දෙනවා. අපේ කණ්ඩායම තුළ බොහෝම කිට්ටු තද බැඳීමක් තියෙනවා. කණ්ඩායම හමු නොවන දවසට අපි එකිනෙකා සමග දුරකථනයෙන් කතා කරනවා."

- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ බිරිඳක්

මෙහෙවර

අපක්ෂපාතී මධ්‍යස්ථ සහ ස්වාධීන සංවිධානයක් වන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සුවිශේෂී මානුෂවාදී මෙහෙවර වන්නේ සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්හි වින්දිතයන් ගේ ජීවිත සහ ගරුත්වය ආරක්ෂා කිරීම සහ ඔවුන්ට ආධාර සැපයීමයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ විශ්ව මානුෂවාදී මූලධර්ම ප්‍රවර්ධනය කරමින් සහ ශක්තිමත් කරමින් මිනිසුන්ගේ දුක්වේදනා නිවාරණයටද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ප්‍රයත්න දරයි. 1863 දී පිහිටුවන ලද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ජිනීවා සම්මුති සහ අන්තර් ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ මුල් සංවිධානයයි. මෙම කමිටුව සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්හිදී මෙම සංවිධානය ඉටු කරන අන්තර්ජාතික කාර්යයන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කරයි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5
ශ්‍රී ලංකාව
දුරකථනः +94 (11) 250 33 46, ෆැක්ස්ः +94 (11) 250 33 48
ඊමේල්ः colombo@icrc.org

වව්නියාව කාර්යාලය
70, වයිරවර් කෝවිල පාර
වයිරවර්පුලියන්කුලම්
වව්නියාව
ශ්‍රී ලංකාව
දුරකථනः +94 (0) 24 222 28 55, ෆැක්ස්ः +94 (0) 24 222 28 37

මඩකලපුව කාර්යාලය
මන්රිසා පාර
කොතුකුලම, පිලයාරඩි
මඩකලපුව
ශ්‍රී ලංකාව
දුරකථනः +94 (0) 65 222 70 70

ICRC

2016.0201/259 09.2016 1600

Cover photo: Joanna Atkinson/ICRC

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් එකිනෙකාට සහයෝගය දැක්වීම

ICRC

ලුහුඬින්

Pascal Jequier/ICRC

"මගේ පුතා අතුරුදහන් වෙලා අවුරුදු 26 ක් වෙනවා. කණ්ඩායමට සහභාගී වෙනකල් අපි ඒ ගැන පවුලෙන් පිට කා එක්කවත් කතා කරලා තිබුණේ නැහැ. කණ්ඩායමට සහභාගී වූ අය එක ගමේ ජීවත් වුණත් මගදී මුණගැසුනොත් සාමාන්‍ය පරිදි කතා කළා මිසක් අපේ හිතේ තියෙන දුක ගැන මීට පෙර කතා කළේ නැහැ. දැන් අපි එකිනෙකා හොඳටම දන්නවා. අපේ අතුරුදහන් වෙච්ච පුතාලා ගැන කතා කරන එකෙන් අවුරුදු ගණනක් හිතේ තිබුණ බර සැහැල්ලු වෙලා."

- අතුරුදහන් වූ පුතෙකුගේ මවක්

Joanna Atkinson/ICRC

Joanna Atkinson/ICRC

Joanna Atkinson/ICRC

Pascal Jequier/ICRC

සහයෝගිතා සත්කාරය

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මගින් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල වන විවිධ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා 2014 වසරේ ඔක්තෝබර් මස සිට 2015 වසරේ නොවැම්බර් මස අතර කාලයේදී දිවයින පුරා සමීක්ෂණයක් දියත් කරන ලදි. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵලත් එහිදී හඳුනාගත් අවශ්‍යතා සපුරාලීමට සුදුසු ක්‍රියාමාර්ගත් දැක්වෙන වාර්තාවක් අප විසින් 2016 වසරේ ජනවාරි මස ශ්‍රී ලංකා රජයට භාර දී ඇත. එමෙන්ම එම වාර්තාව 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කිරීම මගින් අතුරුදහන්වූවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට තම වැඩසටහන් හරහා උපකාර කිරීමට උනන්දු වන වෙනත් පුද්ගලයන් සහ ආයතන දැනුවත් කිරීමටද කටයුතු කර ඇත.

මෙම සමීක්ෂණයට අනුව පෙනී ගියේ අතුරුදහන් වූ පවුල්වල සාමාජිකයන්ට වඩාත්ම අවශ්‍ය වූයේ අතුරුදහන් වූ තම ඥාතියාට සිදුවූයේ කුමක්ද යන්න දැනගැනීමත් අතුරුදහන් වූ තත්වය නිසා ඔවුනට මුහුණ පෑමට සිදුවූ අවිනිශ්චිතතාවයට මුහුණ දීම සඳහා අවැසි මානසික ශක්තිය ලබා දීමත්ය. එමෙන්ම තම ජීවනෝපාය මාර්ගයන් යළි පණ නංවා ගැනීමටත් නීති හා පරිපාලන කටයුතුවලට සහාය ලබාගැනීමටත් අවශ්‍ය විය.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන්ට සහ පවුල්වලට සපයන මානුෂවාදී මෙහෙවර යටතේ ඔවුන් මුහුණපාන මානසික සහ සමාජයීය ගැටලුවලට පිළියම් වශයෙන් සහයෝගිතා සත්කාරය ආරම්භ කර ඇත.

සහයෝගිතා සත්කාරය යනු ඉතා පුළුල් වූ සහායක වැඩසටහනකි. දේශීය රාජ්‍ය නොවන සංවිධානයන් හරහා ක්‍රියාත්මක වන මෙම වැඩසටහන හරහා අතුරුදහන් වූ පවුල්වල සාමාජිකයන් හට,

- තම ඥාතීන් අතුරුදහන් වීම නිසා ඇතිවන අවිනිශ්චිතභාවයටත් වෙනත් සමාජයීය ගැටළුවලට මුහුණ දීමටත් අවශ්‍ය මානසික ශක්තිය සංවර්ධනය කිරීම;
- තම නෛතික, පරිපාලනමය, ආර්ථික ගැටලු සහ අවශ්‍යතාවන් සඳහා සහයෝගය ලබාදීමට හැකි රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන මට්ටමේ සම්පත් පුද්ගලයන් සහ ආයතන වෙත යොමුකිරීම සහ ඊට මාර්ගෝපදේශනය සැපයීම;
- අතිශයෙන්ම ආර්ථික අපහසුතාවන්ට ලක්ව ඇති පවුල්වලට තම ජීවනෝපායන් නැවත පණ ගන්වා ගැනීමට සහ ව්‍යාප්ත කර ගැනීමට සහාය වීම (මේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ප්‍රාදේශීය සම්පත් ලබාගත නොහැකි අවස්ථාවන් හිදී ය) සිදු වෙයි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මගින් මෙම වැඩසටහන 2015 වසරේ නොවැම්බර් මස අනුරාධපුර දිස්ත්‍රික්කයේද, දෙසැම්බර් මස මන්නාරම දිස්ත්‍රික්කයේද, 2016 වසරේ මාර්තු මස ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේද ආරම්භ කරන ලදි. එමෙන්ම එය දිවයිනේ අනෙකුත් තෝරාගත් දිස්ත්‍රික්කවලත් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

සහායකයන්

සහයෝගිතා සත්කාරය ක්‍රියාත්මක වන්නේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කිට්ටු ඥාතීන් හරහාය. ඔවුන්ව මෙම වැඩසටහන තුළ දී "සහායකයන්" වශයෙන් හඳුන්වනු ලබයි. ඔවුහු තමා ජීවත්වන ප්‍රදේශයේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සමග සෘජුවම කටයුතු කරති. මෙම පවුල් වල අවශ්‍යතාවයන් අධ්‍යයනය කිරීමට, නිවසට ගොස් හෝ සහායක කණ්ඩායම් පැවැත්වීම මගින් ඔවුනට අවශ්‍ය මානසික ශක්තිය ලබාදීමටත් එම පවුල්වල නෛතික, පරිපාලන හා ආර්ථික අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා සම්පත් පුද්ගලයන් සහ ආයතන වෙත යොමු කිරීමට හා මාර්ගෝපදේශනය සැලසීම සඳහා ඔවුන් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මගින් පුහුණු කරයි. මෙහිදී සහායකයන් පවුල් වෙත "උපකාර කරන යෙහෙළියක" මෙන් කටයුතු කරන අතරම ඔවුහු තම අතුරුදහන් වූ ඥාතියා පිළිබඳ පිළිතුරු ලැබෙන තෙක් බලා සිටින පවුල් වෙත ජීවිතයෙහි වත්මන සහ අනාගතය වඩාත් යහපත් කරගනු පිණිස මග පෙන්වති.

මෙම වැඩසටහන ක්‍රියාත්මක වන්නේ කෙසේද

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව දේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව මෙම වැඩසටහන දියත් කිරීමෙන් එම සංවිධානවල පළපුරුද්ද සහ ප්‍රවීණත්වය මෙම වැඩසටහනට ද උකහා ගනියි. ශ්‍රී ලංකාවේ යුද පසුබිම තුළ මනෝ සමාජීය සහයෝගිතා වැඩසටහන් හරහා විවිධ ප්‍රජාවන් සමග කටයුතු කර තිබීමේ පළපුරුද්ද මෙම ආයතනයන් තෝරා ගැනීමෙහි ලා ප්‍රධාන වශයෙන් වැදගත් වෙයි. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් වල භූමිකාව වඩාත් හොඳින් තේරුම් ගැනීමටත් ඊට අවැසි සුදුසු විශේෂඥ දැනුම ලබාදීමටත් එම නිසා මෙකී සංවිධාන වලට හැකිවෙයි. දේශීය ආයතනයන් හවුල් කරගැනීම තුළින් මෙම වැඩසටහනෙහි තිරසාර බවද වඩා තහවුරු වෙයි.

සහායකයන් වෙත මූලිකව මනෝ සමාජයීය සහයෝගය ලබාදීම, පවුල් වල අවශ්‍යතාව හඳුනා ගැනීම සහ සම්පත් පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම පිළිබඳව පුහුණුවක් ලබාදෙයි. ඉන් පසුව ඔවුන් පවුල් මුණගැසීම, හිතවත්කම ගොඩනගා ගැනීම, පවුල්වල අවශ්‍යතා හඳුනා ගැනීම මෙන්ම අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය සම්පත් පුද්ගලයන් හා ආයතන හඳුනා ගැනීම පිණිස ඊළග සති 5-6 ගතකරයි.

ඔවුහු අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් වෙත අවශ්‍ය මාර්ගෝපදේශනය ද සලසති. උදාහරණ වශයෙන්, පවුලේ සාමජිකයෙකුට නෛතික හෝ පරිපාලන ගැටළුවක් ඇති විටෙක සහායකයා ඊට අදාළ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානය පිළිපැදිය යුතු ක්‍රියා පිළිවෙත් පිළිබඳව තොරතුරු සොයා බලා එම පවුල දැනුවත් කරයි. අවශ්‍ය නම් එම පුද්ගලයාව මෙම ආයතන වෙත කැටුව ගොස් එම කාර්යය ඉටුකරගැනීමටත් මෙම සහායකයෝ ක්‍රියා කරති. එමෙන්ම දැනට පවත්නා විවිධ උපකාරක වැඩසටහන් වෙත පවුල් යොමු කිරීමද එයින් සේවය ලබා ගැනීමට සහායවීමද සහායකයන් විසින් ඉටුකෙරේ (උදා- සමෘද්ධි, නිවාස ණය, සුළු ව්‍යාපාර ණය). මෙම සේවාවන් ලබා ගැනීමේදී අවශ්‍ය නම් ඉඩම් අයිතිය මාරු කිරීම්, අතුරුදහන් වූ පුද්ගලයාගේ වත්කම් හෝ විශ්‍රාම වැටුපට හිමිකම්කීම, අතුරුදන්වූ බවට සහතිකයක් ලබාගැනීම වැනි වූ සංකීර්ණ පරිපාලන අවශ්‍යතාවයන්ට අදාල ලියකියවිලිද ලබාගත හැකිය.

පුහුණුවේ දෙවන අදියර වනුයේ සහායක කණ්ඩායම් පැවැත්වීම පිළිබඳවය. සහායකයන් තමාට නියමිත ප්‍රදේශයේ පුද්ගලයන් 6-8 වැනි ප්‍රමාණයකින් යුක්ත වූ සහායක කණ්ඩායම් නිර්මාණය කරන අතර මෙම කණ්ඩායම් මාස 3 ක් පමණ මුණගැසෙයි. කණ්ඩායම් සැසියේදී ඊට සහභාගී වන පවුල් සාමාජිකයන්ට තමාගේ දුක්ඛ දෝමනස්සයන්, එදිනෙදා ජීවිතයේ කර්කෂ බව සහ ඔවුන් ඒවා ජයගන්නා ආකාරය පිළිබඳව අනෙකා සමඟ බෙදාගත හැකිය. මෙම අතුරුදහන්වූවන්ගේ ඥාතීන් පවුල තුළ බිරිඳක, මවක, පියෙකු, සහෝදරියක, දියණියක වශයෙන් තම කාර්යභාරය සාකච්ඡා කරන අතර එමගින් තමන් තම පවුලට සහ සමාජයට කෙතරම් වැදගත් දැයි වටහා ගනී. ඔවුහු තමන්ගේ ඥාතියා අතුරුදහන්වීම නිසා මුහුණ පෑමට වූ භාවාත්මක, මනෝ විද්‍යාත්මක, ශාරීරික සහ අන්තර් සම්බන්ධතා ගැටලු පිළිබඳව සාකච්ඡා කරති. එමෙන්ම අතුරුදහන් වූ ඥාතියා පිළිබඳව වන සොඳුරු මතකයන් යළි මතක් කරගති. සහභාගීවන්නෝ මෙම සහායක ජාලය විවිධ ලෙස නිරූපණය කරන අතර තමන් තනිවී නැත යන්න වටහා ගනිති. ඔවුහු අතුරුදහන් වූවන් පිළිබඳ විටෙක කවියකින් ගීතයකින් හෝ සමහර විටෙක අතුරුදහන් වූ ඥාතියා කෑමට රිසිවූ ආහාරක් කණ්ඩායම සමග බෙදා ගනිමින් මෙම මතකයන් තුළ ජීවත් වෙති.

> "කණ්ඩායම් සැසියේදී අපි අපේ දුක්ඛ දෝමනස්සයන් ගැන කතා කරනවා. ඒවා එකිනෙකා සමග බෙදා ගන්නවා. හැම සැසියක්ම අවසන් වෙලා යන්නේ හිත වඩාත් සැහැල්ලු කරගෙන."
>
> - අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ බිරිඳක්